# 2020
# වාර්ෂික වාර්තාව
# ஆண்டு அறிக்கை
# Annual Report



## විජය කුමාරතුංග අනුස්මරණ රෝහල
## விஜய குமரதுங்க நினைவு மருத்துவமனை
## Wijaya Kumaratunga Memorial Hospital

# 2020

# වාර්ෂික වාර්තාව- සිංහල

## විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

# පටුන


| අන්තර්ගතය | පිටු අංකය |
|---|---|
| විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ ඓතිහාසික පසුබිම | 03-04 |
| ආයතනික තොරතුරු | 05-06 |
| ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත වාර් ෂික වාර් තාව ඉදිරිපත් කරන සභාපතිනියගේ ලිපිය | 07 |
| කාර්ය මණ්ඩල වාර්තාව | 08 |
| රෝහල් සේවා විශ්ලේෂණය | 09-17 |
| 2020 වසරේ විශේෂ අවස්ථා හා සපුරාගත් ඉලක්ක හා පරිත්‍යාග | 18 |
| 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර් ය සාධන ප්‍රකාශනය ඇතුලු මූල්‍ය ප්‍රකාශ | 19-33 |
| විගනකාධිපතිවරයාගේ සහතිකය හා විගනකාධිපති වාර් තාව | 34-39 |
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව | |


## දැක්ම

අනගිතම සෞඛ්‍යාරක්ෂාවක් හා ආදර්ශ රෝහලක ආදර්ශය සැපයීම.

## මෙහෙවර

ප්‍රදේශයේ හා රටේ ජනයාගේ සෞඛ්‍ය අවශ්‍යතා පිරිමැසීම සඳහා පහසුකම් හා සේවක මඩුල්ල ඇපකැපව හා කාර්යක්ෂමව භාවිතා කිරීම. කායික රෝග, ශල්‍ය රෝග , අක්ෂි රෝග, දියවැඩියාව හා තුවාල සුව කිරීම යන ක්ෂේත්‍ර වල රාජ්‍ය තලයේ සෞඛ්‍ය තත්වයක් සැපයීම පිණිස රෝහලේ දැනට ඇති පහසුකම් දිගුකාලීනව වැඩිදියුණු කිරීම

## සාමූහික අභිමතාර්තයන්

රෝහලේ අරමුණ වන්නේ ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණෙන පොදු ජනයාට කිසිදු පංති භේදයකින් තොරව අක්ෂි ප්‍රතිකාර, ශල්‍යමය හා දියවැඩියා කළමනාකරණය උසස් අන්දමින් සිදු කරමින් කාර්යක්ෂම සෞඛ්‍ය සේවා සැපයීම.

# විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ 2020 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය
# 2020 ජනවාරි 01 සිට 2020 දෙසැම්බර් 31 දක්වා

## ඓතිහාසික පසුබිම

විජය කුමාරතුංග අනුස්මරන රෝහල ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1998 ජුනි 10 වන දින පලකළ 1998 අංක 31 දරණ විජය කුමාරතුංග අනුස්මරන පදනම ලෙස හඳුන්වන පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත කර ඇත.

විජය කුමාරතුංග අනුස්මරන රෝහල 1988 පෙබරවාරි 16 වන දින ඝාතනය කළ විජය කුමාරතුංග මහතා සිහිවීම පිණිස පිහිටුවිනි. එවකට ජනාධිපති අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් විජය කුමාරතුංග මහතාගේ මුල් ගම වන සීදුව ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් රෝහලක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘතිය දියත් කෙරිනි.

මෙම රෝහල ගම්පහ දිස්ත්‍රික්කයේ කටුනායක-සීදුව නගර සභා සීමාව තුල කොළඹ-මීගමුව ප්‍රධාන මාර්ගයේ සීදුවේ පිහිටි අක්කර තුනක ඉඩමක් විජය කුමාරතුංග අනුස්මරන පදනම මගින් ඉදි කෙරිනි. ආරම්භයේ දී රෝහල වාට්ටු දෙකක් (ඇඳන් 60) ක් හා බාහිර රෝගී අංශයක් සහිත වූ අතර සීදුවේ ජනයාට විශේෂයෙන්ම මූලික සෞඛ්‍යාරක්ෂණ ඒකකයක් බවට පත් විය. එවකට ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් විජය කුමාරතුංග මහතාගේ උපන් දිනය වන 1999 ඔක්තෝබර් 09 දින රෝහල නිල වශයෙන් විවෘත කරන ලදී. රෝහලේ කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් දරණ අතර, අරමුදලේ ප්‍රධාන අරමුදල් ප්‍රවාහය සිදු කරනුයේ රජය මගිනි. අද වන විට රෝහල මගින් වෛද්‍ය , ශල්‍ය සහ අක්ෂි ප්‍රතිකාර සේවා මෙන්ම වෙනත් තෘතීමය ප්‍රතිකාර ලබා දෙමින් විශාල ජනතාවකට සේවය සළසයි.

විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිපත්ති තීරණ ගනු ලබන අතර එහි මෙහෙයුම් හා එදිනෙදා කළමනාකරණය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1999 නොවැම්බර් 12 වන දින පලකළ 1999 අංක 38 දරණ විජය කුමාරතුංග අනුස්මරන පනත ලෙස හඳුන්වන පාර්ලිමේන්තු පනතක් මගින් සිදු කෙරේ. විජය කුමාරතුංග අනුස්මරන රෝහල ප්‍රතිපත්තියක් ලෙස ලාභ තකා පිහිටවූ එකක් නොවනවා වුවද ඊට ආවේනික ගාස්තු ක්‍රමයක් ඇත. මෙහිදී ශෛල්‍යකර්ම සහ වැඩිදුර පරීක්ෂණ වැනි තෝරාගත් ක්ෂේත්‍ර තුල අයකිරීම් සිදු කරනුයේ පිරිවැය ආවරනය කර ගැනීම සඳහා පමණි. එසේ වුවද, අඩු ආදායම්ලාභී ජනයාගෙන් මෙම සාධාරණ අයකිරීම් වුවද අය නොකෙරේ.

වැඩිදියුණු කිරීම් වල කොටසක් ලෙස ඇඳන් 88 කින් සමන්විත අක්ෂි වාට්ටුවක් සහිත වෙනම ගොඩනැගිල්ලක් තැනීම 2004 දී දියත් කර ඇත. ජනයාට උසස් ප්‍රමිතියකින් යුතු සේවාවක් ලබා දීමේ අරමුණින් පවත්නා ප්‍රමිතීන් වැඩිදියුණු කර ශල්‍යාගාරයක් සහිතව පූර්ණ පහසුකම් වලින් යුතු අක්ෂි වාට්ටුවක් 2007 වසරේ දී අරඹන ලද අතර 2007 දී සමස්ථ ඇඳන් ප්‍රමාණය 148 ක් බවට පත් විය.

2012 වසරේ දී දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම අවසන් කර ඇති අතර එය වර්තමානයේ සාමාන්‍ය ගඩබා, රාජකාරී කාමර විවේක කාමර හා දේශන ශාලාවක් වැනි අංග වලින් සමන්විත වේ.

2015 වසරේ දී ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ (NERD) උපදෙස් මත රු. මිලියන 12.431 ක වියදමක් සහිතව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම අවසන් කර ගැනීමට හැකි වී ඇති අතර එය රසායනාගාර ගොඩනැගිල්ල ලෙස නම් කර ඇත. වර්තමානයේ එතුල රසායනාගාරය, වෛද්‍ය ලේඛණාගාරය, අභ්‍යන්තර විගණන ඒකකය , පවුල් වෛද්‍ය සායනය , උපයෝගීතා කාමර ස්ථාපිත කර ඇත.

2016 වසර තුල ශල්‍ය ඒකකය පිහිටුවනු ලැබූ අතර ශල්‍ය වාට්ටුව රසායනාගාර ගොඩනැගිල්ලේ බිම් මහලේ ආරම්භ විනි. එන්ඩොස්කොපි යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම මගින් ශල්‍ය ඒකකයේ 2016 වසර තුල රෝගී ප්‍රතිකාර සේවාලබා දීම පුළුල් කෙරිනි.

2017 ජූලි මාසයේ දී ශල්‍ය වාට්ටුව අක්ෂි ගොඩනැගිල්ලට වෙත මාරු කරන ලද අතර 2017 නොවැම්බර් මාසයේදී බාහිර රසායනාගාරය නව රසායනාගාර ගොඩනැගිල්ල තුල ස්ථාපිත කෙරිනි.යෝජිත වාට්ටු සංකීර්ණ ව්‍යාපෘතියේ ගොඩනැගිලි සැලසුම 2017 අග භාගයේ දී විශ්ලේෂණය කෙරිණ.

2019 වසරේදී යෝජිත වාට්ටු සංකීර්ණය ඉදි කිරීම සම්බන්ධව ප්‍රසම්පාදන කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ආරම්භ කරන ලදී.නමුත් රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත ඉහත යෝජිත වාට්ටු සංකීර්ණ ගොඩනැගිල්ල ඉදි කිරීම් කටයුතු ආරම්භ නොවිනි.

ප්‍රධාන ව්‍යාපෘති වශයෙන් වසර කීපයක සිට අවශ්‍යතාවයක්ව පැවති ශල්‍යාගාර අලුත්වැඩියාව සහ වෛද්‍යවරුන්ගේ විවේකාගාරයක් ඉදි කිරීම 2019 වසරේදී සිදු කර ගැනීමට හැකිවිනි.

2020 වසරේදී ව්‍යාප්ත වූ කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් රෝහල් සේවාවට බාධා ඇති වුවද , ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් හා මාර්ගෝපදේශයන්ට අනුකූලව රෝගී සත්කාර සේවය අඛණ්ඩව පවත්වා ගැනීමට කටයුතු කර ඇත.

ප්‍රධාන ව්‍යාපෘති ලෙස අක්ෂි ගොඩනැගිල්ලට අයත් අක්ෂි හා ශල්‍ය වාට්ටු , අක්ෂි සායන නවීකරණ කටයුතු 2020 වසරේදී සිදු කර ඇත.

වර්තමානයේ වාට්ටු 5 ක් සහ ඇඳන් 137 ක් ඇත . (2020 )

## ආයතනික තොරතුරු
## 01-01-2020 ~ 31-12-2020

### ආයතනයේ නම

විජය කුමාරතුංග අනුස්මරන රෝහල

### ලිපිනය

විජය කුමාරතුංග අනුස්මරන රෝහල, සීදුව

### කළමනාකාරිත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්

### නෛතික වපුහය

1999 අංක 38 දරණ පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවා ඇත.

### විගනකවරු

- විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, 306 /72 , පොල්දූව පාර , බත්තරමුල්ල
- අභ්‍යන්තර විගණන අංශය, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය, අංක 26, ශ්‍රී සංඝරාජ මාවත , කොළඹ 10

## අධ්‍යක්ෂ මණ්ඩලය
## 01-01-2020 ~ 31-12-2020

**සභාපතිනි**

- හිටපු ජනාධිපතිනි අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග

**අධ්‍යක්ෂ මණ්ඩලය**

- වෛද්‍ය අනිල් ජාසිංහ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
- එන්.ඒ. උමගිලිය මයා
- වයි.සුමනා යාපා මිය- භාණ්ඩාගාර නියෝජිත
- ආනන්ද විමලසේන මයා
- රවින්ද්‍ර ඒකනායක මයා

## විගණන කමිටුව

**01-01-2020 ~ 31-12-2020**

### සභාපති

වයි.සුමනා යාපා මිය, අධ්‍යක්ෂ , ජාතික අයවැය දෙපාර්තමේන්තුව,මහා භාණ්ඩාගාරය

### නිරීක්ෂක

ආර්.ජී.ඩී ප්‍රියදර්ශනී මිය , ප්‍රධාන අභ්‍යන්තර විගණක, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය,
ආර්. එම්.ෙක්. කල්්‍යාණී මිය, විගණන අධිකාරි, විගනකාධිපති දෙපාර්තමේන්තුව

### සාමාජික

වෛද්‍ය යූ.එල්.ආර්.එම්. පෙරේරා මහතා, අධ්‍යක්ෂ ,විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

<u>සහභාගිත්වය</u>

වෛද්‍ය එන්.ඩී.එස්.ගුණසේකර , ප්‍රධාන වෛද්‍ය නිලධාරී, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල
පී ඒ එම් පී එන් පෙරේරා , අභ්‍යන්තර විගණක ,විජය කුමාරතුංග අනුස්මරණ රෝහල
පී.ඩී.ටී.පී.එන්.බර්නාඩ් -ගණකාධිකාරී විජය කුමාරතුංග අනුස්මරණ රෝහල
ආර් ඒ ඒ එස් කේ රණසිංහ , පරිපාලන නිලධාරී , විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

## බැංකුකරුවෝ

ලංකා බැංකුව, සීදුව

## සභාපතිවරිය විසින් වාර්ෂික වාර්තාව යොමු කිරීමේ ලිපිය

ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
385, ඛද්දේගම විමලවංශ නාහිමි මාවත
"සුවසිරිපාය",
කොළඹ 10.

**2020 වර්ෂය සඳහා වූ විජය කුමාරතුංග අනුස්මරන රෝහල් පාලක මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශය හා වාර්ෂික වාර්තාව**

1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 14 (2) වගන්තිය අනුව, විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ පාලක මණ්ඩලය වෙනුවෙන් මම 2020 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා වූ විජය කුමාරතුංග අනුස්මරන රෝහල් පාලක මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශය හා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

ස්තුතියි.

මෙයට විශ්වාසී,

චන්ද්‍රිකා ඛණ්ඩාරණායක කුමාරතුංග
සභාපතිනී ,
විජය කුමාරතුංග අනුස්මරන රෝහල,
සිදුව.

පිටපත : ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

**2020 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල වාර්තාව**

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | 2020-12-31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|
| අධ්‍යක්ෂ | 1 | 1 |
| නිර්වින්දන විශේෂඥ වෛද්‍ය | 1 | - |
| කායික රෝග විශේෂඥ වෛද්‍ය | 2 | 1- ස්ථිර<br>1-අමාත්‍යාංශ අනුයුක්ත කිරීම් |
| ශල්‍ය වෛද්‍ය විශේෂඥ | 1 | 1 |
| අන්තරාසර්ග විශේෂඥ වෛද්‍ය | 1 | 0 |
| අක්ෂි ශල්‍ය විශේෂඥ වෛද්‍ය | 2 | - * |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී | 1 | 0 |
| වෛද්‍ය නිලධාරී | 26 | 22 |
| දන්ත ශල්‍ය වෛද්‍ය | 2 | 1 |
| අභ්‍යන්තර විගණක | 1 | 1 |
| ගණකාධිකාරී | 1 | 1 |
| ලියාපදිංචි වෛද්‍ය නිලධාරී | 2 | 3 |
| විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී | 1 | 1 |
| හෙද සොයුරි | 2 | 1 |
| හෙද නිලධාරී | 81 | 70 |
| පරිපාලන නිලධාරී | 1 | 1 |
| ඖෂධවේදී | 6 | 6 |
| විකිරණශිල්පී | 2 | 2 |
| වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | 5 | 4 |
| අක්ෂි තාක්ෂණවේදී | 4 | 3 |
| පෝෂණවේදී | 1 | 0 |
| වැඩ මූලික | 1 | 0 |
| වායු සමීකරණ කාර්මික ශිල්පී | 1 | 0 |
| විද්‍යුත් බන්ධු රේඛණ ශිල්පී | 1 | 1 |
| කලමණාකරණ සහකාර | 11 | 9 |
| ඖෂධ සංයෝජක | 3 | 2 |
| ආහාර නිරීක්ෂිකා | 1 | 1 |
| නිවාස භාරකාරිනී | 1 | 0 |
| වෛද්‍ය ලේඛණාගාර සහකාර | 1 | 1 |
| රියදුරු | 5 | 3 |
| විදුලි කාර්මික | 1 | 1 |
| නඩත්තු කම්කරු | 3 | 3 |
| ලැබ් ඕඩර්ලි | 2 | 0 |
| අරක්කැමි | 3 | 2 |
| දූකරථන ක්‍රියාකරු/පිලිගැනීමේ නිලධාරී | 3 | 0 |
| සෞඛ්‍ය කාර්ය සහයක | 69 | 65 |
| **එකතුව** | **250** | **208** |

* වැඩ බලන අක්ෂි ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයෙක් ලෙස වෛද්‍ය නිලධාරී තනතුරේ සේවය කරන වෛද්‍යවරයෙකු රාජකාරී ආවරණය කර ඇත.

# රෝහල මගින් ලබා දෙන සේවා

## හැඳින්වීම

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල මගින් බාහිර ප්‍රතිකාර සේවා හා අභ්‍යන්තර ප්‍රතිකාර සේවා යන දෙවර්ගයම ලබා දේ. බාහිර රෝගී අංශය (OPD), ප්‍රාථමික සත්කාර ඒකකය (PCU), එන්ඩොස්කොපි ඒකකය හා විශේෂිත සායන මගින් බාහිර ප්‍රතිකාර සේවා සළසා දේ. කායික වෛද්‍ය වාට්ටු, ශල්‍ය වාට්ටු, අක්ෂි වාට්ටු, තුවාල සත්කාරක වාට්ටුව හා ශල්‍යාගාර මගින් අභ්‍යන්තර සේවා සළසා දේ. 2020 වසරේ වාට්ටුගතව ප්‍රතිකාර ලබා ගත් ප්‍රමාණය 66.69% ක් විය.

2020 වසරේදී මුලු රෝගී වාට්ටුගත ඇතුලත්වීම් 8,850 ක් විය.

2020 වසරේදී ඇති වූ කොවිඩ් වසංගත තත්වය මත සායනික රෝගීන්ට ඖෂධ තැපැල් කර යැවීම සිදු කරන ලද අතර ඉන්සියුලින් වැනි ඖෂධ රෝගීන්ට පැමිණ ලබා ගැනීමට අවස්ථා සලසා දුනි. එහිදී ඉතාමත් ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කර ඇත.

රෝගී ප්‍රතිකාර සේවා සඳහා රෝහලේ පිහිටි ඩිස්පෙන්සරිය, එක්ස් කිරණ ඒකකය, වෛද්‍ය රසායනාගාරය හා ඊසීජී ඒකකය ඉවහල් වේ. විශේෂිත නොවන මෙන්ම විශේෂිත සේවා රෝහල මගින් මහජනයාට ලබා දේ. මෙම රෝහල ඒ වර්ගයේ ප්‍රාදේශීය රෝහලක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2020 වසරේදී වර්ග කර ඇත.

අභ්‍යන්තර කළමණාකරනය අවශ්‍ය වන වෛද්‍ය, ශල්‍ය හා අක්ෂිමය සංකූලතා සහිත රෝගීන් බාහිර රෝගී අංශය, හදිසි ප්‍රතිකාර ඒකකය හා විශේෂිත සායන වලින් වාට්ටු වලට ඇතුළත් කෙරේ. MRI, CT ස්කෑන් වැනි විශේෂ පරීක්ෂණ අවශ්‍යවන රෝගීන්ව ජාතික රෝහල, රාගම උතුරු කොළඹ ශික්ෂණ රෝහල වැනි රෝහල් වලට යොමු කෙරේ.

## 1. බාහිර රෝගී අංශය (OPD)

රෝහලේ බාහිර රෝගී අංශයට පැමිණෙන රෝගීන්ගෙන් වැඩි දෙනෙකු පැමිණෙන්නේ සීදුව කොටුගොඩ,රද්දොළුව ,කඳාන, ජා ඇල හා කටුනායක වැනි ප්‍රදේශ වලිනි. කටුනායක අපනයන සැකසුම් කලාපයේ කාර්ය මණ්ඩල ද ඒ අතර වේ. ඊට අමතරව,මිනුවන්ගොඩ හා ගම්පහ ප්‍රදේශ වලින්ද ප්‍රතිකාර තකා රෝගීන් මෙම රෝහලට පැමිණේ.

2020 වසර තුල බාහිර රෝගී අංශයේ ප්‍රතිකාර ලැබූ මුළු සංඛ්‍යාව 71,212 ක් වූ අතර රෝගීන් සීමා නොකර පෙ.ව. 8 සිට ප.ව. 4 දක්වා ප්‍රතිකාර ලබා දීම සිදු විය. තවද විශේෂඥ පවුල් වෛද්‍යවරයෙකුගේ සේවය බාහිර රෝගී අංශය තුලන් ලබා ගැනීමට හැකි වීම නව සේවාවක් ලෙස හැදින්විය හැක.

බාහිර රෝගී අංශය මගින් සැරහුම් යෙදීම් 8,703 ක් හා එන්නත් ලබා දීම් 1,102 ක් ද සිදු කර ඇත.

1 වගුව මගින් බාහිර රෝගී අංශයට සම්බන්ධ පසුගිය වසර 5 තුල තත්වය විදහා දැක්වේ.

## 2. <u>ප්‍රාථමික සත්කාර ඒකකය (PCU)</u>

හදිසි ප්‍රතිකාර ඒකකය ලෙස පැවති මෙම ඒකකය 2020 දී ප්‍රාථමික සත්කාර ඒකකය ලෙස ක්‍රියාත්මක වීම ආරම්භ විනි.

පැය විසිහතර පුරා විවෘතව ඇති ප්‍රාථමික සත්කාර ඒකකය මගින් රෝහලට ගෙන එන හදිසි ප්‍රතිකාර අවශ්‍ය රෝගීන් සියල්ලට සත්කාර සැලසේ. මාර්ග අනතුරු, කාර්මික අනතුරු හා අපනයන සැකසුම් කලාපයේ ඇති වන කර්මාන්තශාලා අනතුරු හා ගෘහස්ත හදිසි අනතුරු වලින් පීඩාවට ලක්වන්නන් හදිසි ප්‍රතිකාර ඒකකයට රැගෙන එනු ලැබේ. සිදු කරනු ලබන ප්‍රතිකාර වලට අමතරව විශේෂිත වෛද්‍ය සත්කාර අවශ්‍ය වන රෝගීන් විශේෂිත ප්‍රතිකාර සඳහා ආසන්නයේ ඇති රෝහල් වෙතට මාරු කෙරේ.

ප්‍රාථමික සත්කාර ඒකකයෙන් 2020 වසර තුල ප්‍රතිකාර ගත් මුළු රෝගී සංඛ්‍යාව 15,134 ක් විය.ගත වූ වසර 5 ට අදාළව ප්‍රාථමික සත්කාර ඒකකයේ සංඛ්‍යා ලේඛන 1 වගුව තුල දක්වා ඇත

## 3. <u>දන්ත ඒකකය</u>

දන්ත ඒකකය සඳුදා සිට සෙනසුරාදා දක්වා රෝගීන් සඳහා විවෘතව තැබේ. සෙනසුරාදා දිනවල පාසැල් සිසුන් සඳහා ප්‍රමුඛත්වය ලබා දේ.

සාමාන්‍ය දන්ත ප්‍රතිකාර, දත් ගැලවීම්, පිරවීම් ,දත් සුද්ද කිරීම , ළමා දන්ත ප්‍රතිකාර, සුළු සැත්කම් ප්‍රතිකාර සායනය තුලදී සිදු කෙරේ. මියුකොසිල් ඉවත් කිරීම, පළුදු වූ 3 වන මොලර් ඉවත් කිරීම සහ මාර්ග අනතුරු වලින් සිදු වූ දන්ත අබාධ ප්‍රතිකාර යන ප්‍රතිකාර සිදු කරන සුළු සැත්කම් අතර කිහිපයකි.
2020 වසර තුලදී දන්ත ඒකකයට පැමිණි සමස්ත රෝගී සංඛ්‍යාව 4,757 ක් විය. ගත වූ වසර 5 තුල දන්ත ඒකකයේ සංඛ්‍යාලේඛන 1 වගුව තුල දක්වා ඇත.

## 4. <u>කායික වෛද්‍ය ඒකකය</u>

කායික වෛද්‍ය ඒකකය වාට්ටු 2 කින් හා වෛද්‍ය සායනයකින් සමන්විත වේ. පිරිමි වාට්ටුවෙහි ඇඳන් 19 ක් ද ගැහැණු වාට්ටුවෙහි ඇඳන් 23 ක් ද ඇත. වෛද්‍ය සායනය සඳුදා සිට සෙනසුරාදා දක්වා පවත්වනු ලැබේ. දියවැඩියාව,අධි රුධිර පීඩනය , ඇදුම සහ වෙනත් කායික රෝග වැලඳී ඇති රෝගීන් හට මෙම සායනයේදී ප්‍රතිකාර ලබා දේ.සෙනසුරාදා දිනයේ අන්තරාසර්ග රෝග පිලිබඳ විශේෂඥ වෛද්‍යවරියක විසින් පවත්වනු ලබන අන්තරාසර්ග රෝග සායනයක් පැවැත්විනි.එය විශේෂිත දියවැඩියා සායනයක් ද විය.
2020 වසර තුල වෛද්‍ය සායනයෙන් සේවා ලබාගත් මුළු රෝගී සංඛ්‍යාව 34,012 ක් විය. ගතවූ පස් වසර තුල වෛද්‍ය සායනය, වාට්ටු අංක 1 (පිරිමි වාට්ටුව ) හා 2 (ගැහැණු වාට්ටුව) ට සම්බන්ධ සංඛ්‍යාලේඛන 2 වන වගුව තුල දක්වා ඇත.

### <u>වෙනත් විශේෂ සායනය</u>

- <u>පවුල් වෛද්‍ය සායනය</u>

සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් පවුල් වෛද්‍ය විශේෂඥවරයෙකු මෙම රෝහලට අනුයුක්තව සිටී. පවුල් වෛද්‍ය විශේෂඥ සායනය පැවැත්වීම , බාහිර රෝගී අංශය තුල විශේෂඥ සේවා වෙත යොමු කිරීම් සිදු කිරීම , බාහිර රෝගී අංශයේ විශේෂඥ සේවා ඇරඹීම , බාහිර සෞඛ්‍ය අධ්‍යාපන මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි ප්‍රාථමික සත්කාර සේවාවන් ද මෙමගින් ආරම්භ විය .
2020 වසරේ පවුල් වෛද්‍ය විශේෂඥ සායනය වෙත රෝගීන් 6,929 ක් පැමිණ ඇත.

- **<u>වෙනත් සායන ( බෝ නොවන රෝග සායනය ,සුවනාරි සායනය )</u>**

මීට අමතරව බෝ නොවන රෝග( NCD) සායනය හා සුව නාරි හා පවුල් සංවිධාන සායනය සතිපතා ශ්‍රේනිගත වෛද්‍ය නිලධාරීන් විසින් සිදු කෙරිනි. බෝ නොවන රෝග හා සුවනාරි සායන මගින් 2020 වසර තුලදී පිළිවෙලින් රෝගීන් 279 හා 15 දෙනෙකුට ප්‍රතිකාර ලබා දී ඇත.
ගත වූ වසර පහ තුල වෙනත් සායන වල දත්ත 3 වන වගුව තුල දැක්වේ.

- **<u>ජංගම සායන Visiting clinic</u>**

බාහිර විශේෂඥ වෛද්‍යවරුන් විසින් පවත්වන සායන හතරක් දියවැඩියා හා අධික රුධිර පීඩන සායනය ,ළමා රෝග සායනය, මානසික රෝග සායනය හා උගුර කණ නාසය පිලිබඳ සායනය සතිපතා පැවැත්විනි. 2020 වසර තුල දියවැඩියා හා අධික රුධිර පීඩන සායනය ,ළමා රෝග සායනය, මානසික රෝග සායනය හා උගුර කණ නාසය පිලිබ්ද සායනය සඳහා මුළු රෝගී සංඛ්‍යාව පිළිවෙලින් 5,413 ,182 , 1,895 හා 135 ක් විය.

අන්තරාසර්ග රෝග පිලිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු රෝහලේ නොමැති වුවද බාහිර විශේෂඥ වෛද්‍යවරියක විසින් අන්තරාසර්ග රෝග පිලිබඳ සායනයක් පවත්වන ලදී.

ගත වූ වසර පහ තුල ජංගම සායන වල දත්ත 4 වන වගුව තුල දැක්වේ.

## 5. <u>ශල්‍ය ඒකකය</u>

ශල්‍ය ඒකකය 2016 මැද භාගයේ දී අලුතින් ස්ථාපිත කරන ලදී . එක් විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයෙකුගෙන් සහ වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකුගෙන් ශල්‍ය ඒකකය සමන්විත වේ. වර්තමානයේ ඇඳන් 24 කින් යුතු වාට්ටුවක් මෙම ඒකකය සතු වේ.2016 අවසාන භාගයේදී ශල්‍ය ඒකකය වෙත නවීන එන්ඩොස්කොපි යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම සිදු විය.

2020 වසර තුල ශල්‍ය ඒකකය මගින් ලබා දුන් සේවාවන් පහත පරිදි වේ.

| විස්තරය | මුලු සංඛ්‍යාව |
|---|---|
| 2020 වසරේ සායනික රෝගීන් සංඛ්‍යාව | 3261 |
| මුලු ශල්‍යකර්ම සංඛ්‍යාව | 675 |
| ප්‍රධාන ශල්‍යකර්ම සංඛ්‍යාව | 497 |
| සුලු ශල්‍යකර්ම සංඛ්‍යාව | 178 |
| ඩ්‍රප්ලෙක්ස් ස්කෑන් සංඛ්‍යාව | 454 |
| Sclerotherapy ක්‍රියා පටිපාටිය | 219 |
| පී ආර් පී එන්නත් ලබා දීම | 256 |
| එම් පී එන්නත් ලබා දීම | 64 |
| FNAC ක්‍රියා පටිපාටිය | 5 |
| මුලු එන්ඩොස්කොපි පරීක්ෂණ සංඛ්‍යාව | 748 |
| UGIE ක්‍රියා පටිපාටිය | 68 |
| LGIE ක්‍රියා පටිපාටිය | 226 |
| කොලනොස්කොපි සංඛ්‍යාව | 22 |
| Proctoscopy පටිපාටිය සහ Sclerotherapy එන්නත් සංඛ්‍යාව | 224 |
| බයොප්සි - UGIE සහ LGIE | 38 |

## තුවාල සත්කාර සායනය හා වාට්ටුව

විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයාගේ උපදේශනය යටතේ පාලනය වන මෙම අංශය ඇඳන් 20 කින් යුත් වාට්ටු එකකින් හා සායනයකින් සමන්විත විය.
2020 වසරේ තුවාල සත්කාර සායනය වෙත පැමිණි රෝගීන් සංඛ්‍යාව 11,179 ක් විය.

ගත වූ වසර පහ තුල මේ පිලිබඳ දත්ත 5 වන වගුව තුල දැක්වේ.

## 6. අක්ෂි ඒකකය

වැඩ බලන විශේෂඥ අක්ෂි ශල්‍ය වෛද්‍යවරයෙකු හා වෛද්‍ය නිලධාරීන් 5 දෙනෙක් මෙම අංශයට අනුයුක්ත කර ඇත .
මෙම ඒකකය ට අක්ෂි සායනය, ඇඳන් 40 කින් යුත් අක්ෂි වාට්ටුව හා අක්ෂි ශල්‍යාගාරය ඇතුළත් වන අතර මෙම ඒකකය මගින් පහත සේවාවන් ලබා දී ඇත.
අක්ෂි සැත්කම්
අක්ෂි සායන
පැය 24 පුරා ක්‍රියාත්මක අනතුරු කලමණාරකණ සේවාවන්
අක්ෂි පරීක්ෂණ
ලේසර් ප්‍රතිකාර
අක්ෂි කදවුරු

- **අක්ෂි සැත්කම්**

ප්‍රධාන වශයෙන්ම ඇසේ සුදු ඉවත් කිරීමේ ශල්‍යකර්ම සිදු කරනු ලබන අතර සිදු කරන ලද ශල්‍යකර්ම වර්ග පහත දැක්වේ.




2020 වසර තුල ප්‍රධාන අක්ෂි ශල්‍යකර්ම 3519 ක් හා සුලු ශල්‍යකර්ම 205 ක් සිදු කර ඇත.ඒ අ අනුව මුලු අක්ෂි ශල්‍යකර්ම සංඛ්‍යාව 3,724 ක් වේ.

- **<u>අක්ෂි සායන</u>**

ඕනෑම රෝගියෙකුට සතියේ සෑම දිනකම සාමාන්‍ය අක්ෂි සායනවලට සහභාගී විය හැක.දිවයිනේ සෑම ප්‍රෙද්ශයකින්ම විවිධ අක්ෂි ආබාධ සහිත රෝගීන් මෙම සායන වලට පැමිණ ඇත. medical retina, surgical retina, uveitis, variety of corneal diseases, strabismus, ocular tumours , oculoplasty and neuro-ophthalmic cases වැනි ගැටලු සහිත රෝගීන්ට මෙහිදී ප්‍රතිකාර සැලසේ.

සාමාන්‍ය අක්ෂි සායනයට අමතරව දියවැඩියා සායනය ග්ලූකෝමා සායනය මෙන්ම ළමා සායනයද පැවැත්වේ.

2020 වසරේදී සාමාන්‍ය අක්ෂි සායන රෝගීන් 30,078 ක්ද , අක්ෂි දියවැඩියා සායන රෝගීන් 20 ක්ද , ග්ලූකෝමා සායන රෝගීන් 103 ක් ද , ළමා අක්ෂි සායන රෝගීන් 173 ක් ද සඳහා ප්‍රතිකාර සලසා ඇත.

- **<u>පැය 24 පුරා ක්‍රියාත්මක අනතුරු කලමණාරකණ සේවාව</u>**

2020 වසරේදී අක්ෂි වාට්ටුව වෙත පැමිණි අනතුරු සහ හදිසි රෝගීන් 2273 ක් සඳහා ප්‍රතිකාර ලබා දී ඇත.

- **<u>අක්ෂි පරීක්ෂණ</u>**

මෙහිදීපහත පරීක්ෂණ සිදු කරනු ලැබේ.

I. දෘෂ්ඨී විතාන පරීක්ෂණ- Spectral domain OCT machine, B scanner, FFA
II. ග්ලූකෝමා පරීක්ෂණ-, OCT- RNFL
III. Biometry පරීක්ෂණ - A and B ultrasound scanner, IOL master

- **<u>ලේසර් ප්‍රතිකාර</u>**

ලේසර් පහසුකම භාවිතයෙන් දියවැඩියා රෙටිනෝපති කලමණාරකණය විශාල ප්‍රමාණයක් සිදු කරනු ලබන අතර දෘෂ්ඨී විතානයේ ශිරා අවහිරතා , දෘෂ්ඨී විතානයේ පර්යන්ත පරිහානිය ආදිය ඉවත් කර ඇත . PRP ලේසර් 245 ක්ද , FLT 99 ක්ද , YAG CAP ලේසර් 316 ක්ද , YAG PI ලේසර් 28 ක්ද , වෙනත් ලේසර් 35 ක්ද ඇතුලුව 2020 වසර තුල මුලු ලේසර් ප්‍රතිකාර 723 ක් සිදු කර ඇත.

- **<u>නොමිලේ පැවැත්වුනු අක්ෂි කඳවුරු</u>**

2020 වසරේ සබරගමුව පළාත තුල නොමිලේ අක්ෂි කඳවුරු 4 ක් පවත්වා ඇති අතර රෝගීන් 115 කට ප්‍රතිකාර කර ඇත.

## <u>සහයක සේවා</u>

## <u>7.</u> <u>වෛද්‍ය රසායනාගාරය</u>

වෛද්‍ය රසායනාගාරය නවීන පහසුකම් වලින් යුත් උපකරණ වලින් සමන්විත වන අතර ලේ සාම්පල් ලබා ගැනීම විධිමත් කිරීම සඳහා වෙනම සාම්පල් කාමරයක් ස්ථාපිත කර ඇත. වෛද්‍ය රසායනාගාරය තුල වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයින් සිව්දෙනෙක් අනුයුක්තව ඇත.

2020 වසරේ සිදු කල රසායනාගාර පරීක්ෂණ මුළු සංඛ්‍යාව 69,697 ක් විය.

## <u>8.</u> <u>ඊ.සී.ජී.අංශය</u>

විද්‍යුත් බන්තු රේඛණ ශිල්පියෙකු විසින් මෙහෙයවන ඊසීජී (ECG) ඒකකය මගින් බාහිර රෝගීන්ට මෙන්ම නේවාසික රෝගීන්ට සේවාව සැපයේ. මෙම අංශය විවෘතව තබන කාලයෙන් පරිබාහිර කාලයේදී අත්‍යාවශ්‍ය රෝගීන්ගේ ඊ සී ජී ප්‍රාථමික සත්කාර ඒකකයෙන් සිදු කරනු ලැබේ.

සිදු කල මුලු මුළු ඊසීජී පරීක්ෂණ සංඛ්‍යාව 5,409 ක් විය.

## 9. එක්ස් කිරණ අංශය

විකිරණ ශිල්පීන් දෙදෙනෙකුගෙන් සමන්විත එක්ස් කිරණ ඒකකය සියළු වර්ගවල ශාරීරික එක්ස් කිරණ ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් වලින් සමන්විතව ඇත.නවීන **CR** යන්ත්‍රයක් මෙහි ස්ථාපිත කර ඇති අතර එමගින් ඩිජිටල් එක්ස් රේ මුද්‍රණය සිදු කෙරේ.මේ නිසා රසායන ද්‍රව්‍ය යොදා ගෙන සිදු කරනු ලබන පැරණි ක්‍රමවේදය ඉවත් වූ බැවින් රසායන ද්‍රව්‍ය වලින් විකිරණශිල්පීන්ට මෙන්ම රෝගීන්ට ද වන හානිය අවම වූ අතර එකස් රේ වල ගුණාත්මක බව ද වැඩි විනි.

2020 වසර තුල ලබා ගත් එක්ස් කිරණ සංඛ්‍යාව **1,929** ක් විය.

ගතවූ පස් වසරේ සහායක සේවා පිළිබඳ සංඛ්‍යා ලේඛන 7 වන වගුව තුල දක්වා ඇත.

## රෝගී සේවාවන් සම්බන්ධ සංඛ්‍යාලේඛණ සාරාංශය

අංක 1 වගුව

| අංශය/වර්ෂය | පැමිණි රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
| බාහිර රෝගී අංශය | 131,953 | 117,080 | 103,420 | 109,102 | 71,212 |
| ප්‍රාථමික සත්කාර ඒකකය | 20,901 | 23,054 | 21,718 | 22,435 | 15,134 |
| දන්ත ඒකකය | 8,057 | 7,556 | 8,756 | 6,711 | 4,757 |

කායික වෛද්‍ය ඒකකය

අංක 2 වගුව

| අංශය/වර්ෂය | පැමිණි රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
| වෛද්‍ය සායනය-කායික වෛද්‍ය | 43,282 | 43,180 | 40,695 | 42,436 | 34,012 |

| අංශය/වර්ෂය | වාට්ටුගත රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
| වෛද්‍ය වාට්ටු අංක 1 - පිරිමි | 1,541 | 1,434 | 1,509 | 1,140 | 731 |
| වෛද්‍ය වාට්ටු අංක 2 - ගැහැණු | 1,973 | 1,802 | 2,238 | 1,555 | 1,046 |

වෙනත් විශේෂ සායන

අංක 3 වගුව

| අංශය/වර්ෂය | පැමිණි රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
| පවුල් වෛද්‍ය සායනය | | | 2,123 | 5,336 | 6,929 |
| බෝ නොවන රෝග සායනය | 49 | 566 | 484 | 523 | 279 |
| සුවනාරි සායනය | 116 | | 74 | 58 | 15 |

ජංගම සායන

අංක 4 වගුව

| අංශය/වර්ෂය | පැමිණි රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
| දියවැඩියා අධිරුධිර පීඩන සායනය | 2,346 | 3,046 | 3,548 | 3,897 | 5,413 |
| ළමා රෝග සායනය | 1,295 | 1,145 | 904 | 532 | 182 |
| මානසික රෝග සායනය | 2,056 | 2,609 | 2,344 | 1,915 | 1,895 |
| උගුර කණ නාසය සායනය | | | | 339 | 135 |

ශල්‍ය අංශය

අංක 5 වගුව

| අංශය/වර්ෂය | රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
| ශල්‍ය සායනය | 2,415 | 3,697 | 4,494 | 4,427 | 3,261 |
| එන්ඩොස්කොපි පරීක්ෂණ | | 657 | 950 | 1,085 | 748 |
| සාමාන්‍ය ශල්‍යකර්ම | 477 | 889 | 1,023 | 1,047 | 675 |
| ශල්‍ය වාට්ටු 6 - ගැහැණු සහ පිරිමි | - | 2,631 | 3,541 | 3,512 | 2,544 |
| තුවාල සත්කාර ඒකකය | 24,221 | 19,926 | 15,556 | 16,745 | 11,179 |
| වාට්ටු 5 - තුවාල සත්කාර වාට්ටුව - ගැහැණු සහ පිරිමි | 292 | 408 | 358 | 279 | 119 |

<u>අක්ෂි අංශය</u>

අංක 6 වගුව

| අංශය/වර්ෂය | පැමිණි රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
| අක්ෂි සායනය | 69,338 | 49,423 | 47,570 | 47,854 | 30,078 |
| අක්ෂි ශල්‍යකර්ම | 10,910 | 1,994 | 1,336 | 2,849 | 3,724 |
| අක්ෂි වාට්ටුව අංක 3 - පිරිමි | 5,789 | 3,129 | 1,863 | 3,747 | 4,410 |
| අක්ෂි වාට්ටුව අංක 4 - ගැහැණු | 8,325 | | | | |
| ලේසර් ප්‍රතිකාර | 1,943 | 962 | 1,648 | 988 | 723 |
| Refractive පරීක්ෂණ | 15,193 | 7,484 | 8,622 | 2,197 | 5,602 |

<u>සහයක සේවා</u>

අංක 7 වගුව

| අංශය/වර්ෂය | රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
| රසායනාගාර පරීක්ෂණ | 59,178 | 90,605 | 111,620 | 101,066 | 69,697 |
| එක්ස්රේ පරීක්ෂණ | 5,478 | 2,796 | 4,728 | 3,791 | 1,929 |
| ECG පරීක්ෂණ | 4,303 | 7,344 | 7,776 | 8,882 | 5,409 |

සෞඛ්‍ය අමාත්‍යාංශ වාර්තා වලට අනුව 2020 වසර තුල විජය කුමාරතුංග රෝහල තුල රෝගීන් ගේ ප්‍රධාන රෝහල්ගතවීම්

| | රෝහල්ගත වීමට හේතුව සහ අයි සී ඩී කේතය | රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | Diseases of the eye and adnexa (H00-H59) | 4343 |
| 2 | Diseases of the gastrointestional tract (K20-K92) | 804 |
| 3 | Diseases of skin and subcutaneous tissue (L00-L99) | 753 |
| 4 | Disorders of the musculoskeletal system (M00-M99) | 450 |
| 5 | Other diseases of the circulatory system (I70-I99) | 442 |
| 6 | Signs, symptoms and abnormal clinical findings (R00-R99) | 391 |
| 7 | Diabetes mellitus (E10-E14) | 289 |
| 8 | Viral diseases (A80-B34) | 166 |
| 9 | Diseases of the resp. system exclu... (J20-J22, J40-J98) | 114 |
| 10 | Ischaemic heart disease (I20-I25) | 106 |
| 11 | Diseases of the urinary system (N00-N39) | 88 |
| 12 | Hypertensive diseases (I10-I15) | 81 |
| 13 | Intestinal infectious diseases (A00-A09) | 74 |
| 14 | Diseases of the nervous system (G00-G98) | 64 |
| 15 | Other bacterial diseases (A20-A49) | 60 |
| 16 | Traumatic injuries (S00-T19, W54) | 53 |
| 17 | Diseases of breast (N60-N64) | 37 |
| 18 | Complications of surgical and medical care... (T80-T88) | 35 |
| 19 | Pneumonia (J12-J18) | 21 |
| 20 | Iron dificiency anaemias (D50) | 19 |

## 2020 වසරේ විශේෂ අවස්ථා

- වාර්ෂික ලේ දන්දීමේ ව්‍යාපාරය 2020 පෙබරවාරි 16 දින පැවැත්විනි.

## 2020 වසරේ සපුරාගත් ඉලක්ක

1) **<u>වෛද්‍ය උපකරණ මිලදී ගැනීම්</u>**

<u>ප්‍රධාන වෛද්‍ය උපකරණ-</u>

| | |
|---|---|
| අල්ට්‍රාසවුන්ඩ් ස්කෑනර් යන්ත්‍රය | -Rs. 3,480,000/- |
| Fistuleoscope - Video Assisted AnalFistulectomy set & Operating Rectoscope System | -Rs. 4,300,000/- |
| ඩයතම් යන්ත්‍රය | -Rs. 1,264,000/- |
| වෙනත් වෛද්‍ය උපකරණ | -Rs. 2,627,133/- |

2) **<u>ලී බඩු සහ සවිකිරීම් , යන්ත්‍රෝපකරණ සහ පරිගණක උපකරණ මිලදී ගැනීම්</u>**

මේ සඳහා වැය වූ මුලු මුදල රු. 4,683,318.00ක් විය.

3) **<u>යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම</u>**

**<u>ප්‍රධාන ගොඩනැගිලි කාර්යන්</u>**

- අක්ෂි සායනයේ නවීකරණය - විදුලි සැපයුම් පද්ධතිය සැකසීම -රු.1,283,008/-
- අක්ෂි ගොඩනැගිල්ලේ බිම් මහල ටයිල් කිරීම - රු.3,158,150/-
- අක්ෂි ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම රු.4,397,087/-
- අක්ෂි ගොඩනැගිල්ලේ මල අපවහන පද්ධතිය අලුත්වැඩියාව - රු.2,021,281/-
- වාට්ටු අංක 1 හි සිවිලිම අලුත්වැඩියාව - රු.2,068,680/-

## 2020 වසරේ පරිත්‍යාග

වෛද්‍ය හේමන්ත ගමගේ මහතා විසින් ලක්ෂ 40 ක් වටිනා Normal Air Oxygen concentration Converting Machine යන්ත්‍ර 2ක් රෝහල වෙත පරිත්‍යාග කර ඇත.

# 2020/12/31 දිනට මූල්‍ය ප්‍රකාශන

## විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

# විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය
## 2020 දෙසැම්බර් 31 දිනට

| | | 2020 | 2019 (ප්‍රතිශෝධනය ) |
|---|---|---|---|
| **ආදායම** | | | |
| රාජ්‍ය ප්‍රදාන පුනරාවර්තන | | 341,192,500.00 | 310,499,000.00 |
| ප්‍රාග්ධන ප්‍රධාන ක්‍රමක්ෂය | | 26,471,919.33 | 22,818,003.08 |
| ආධාර ලෙස ලද වත්කම් වල ක්‍රමක්ෂය | | 2,345,950.00 | 3,789,650.00 |
| වෙනත් ආදායම් | 15 | 14,767,143.40 | 16,141,759.68 |
| **සමස්ත ආදායම** | | 384,777,512.73 | 353,248,412.76 |
| **වියදම** | | | |
| වැටුප් වේතන සහ සේවක සුභසාධන | 16 | 250,626,050.89 | 228,572,459.79 |
| සැපයුම් හා භාවිත දෑ | 19 | 126,565,682.95 | 106,287,654.26 |
| ක්ෂය | 17 | 28,817,869.33 | 26,607,653.08 |
| වෙනත් වියදම් | 18 | 52,417,476.15 | 56,749,570.82 |
| **සමස්ත වියදම්** | | 458,427,079.32 | 418,217,337.95 |
| **අතිරික්තය /(හිඟ ) අදාල කාලයේ** | | **(73,649,566.59)** | **(64,968,925.19)** |

## විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

## මූල්‍ය තත්වය ප්‍රකාශනය

**2020** දෙසැම්බර් **31** දිනට

| | | **2020** | **2019** (ප්‍රතිශෝධනය ) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ මුදල් වලට සමාන දෑ | 1 | 31,090,959.52 | 37,669,054.86 |
| ලැබීමට නියමිත දෑ/සේවක ණය | 2 | 12,093,263.69 | 11,624,783.61 |
| තොග -බෙහෙත් ද්‍රව්‍ය හා අනෙකුත් තොග | 3 | 32,901,080.04 | 28,169,944.38 |
| පූර්ව ගෙවීම්- ඉදිරි වර්ෂයටඅදාල ගෙවීම් | 4 | 410,392.30 | 437,552.14 |
| | | 76,495,695.55 | 77,901,334.99 |
| ප්‍රාග්ධන කාරක ප්‍රගතිය | 5 | 1,291,093.87 | 662,076.27 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| යටිතල පහසුකම් පිරියත හා උපකරණ | 6 | 70,248,871.96 | 75,179,203.56 |
| ඉඩම් හා ගොඩනැගිලි | 7 | 182,002,647.21 | 175,535,514.82 |
| | | 252,251,519.17 | 250,714,718.38 |
| **මුළු වත්කම්** | | 330,038,308.59 | 329,278,129.64 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | 8 | 15,212,053.51 | 20,909,905.31 |
| ණය හිමි | 9 | 114,358,932.46 | 41,661,508.17 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 10 | 46,035,785.38 | 38,942,743.00 |
| **සමස්ත වගකීම්** | | 175,606,771.35 | 101,514,156.48 |
| **ශුද්ධ වත්කම්** | | **154,431,537.24** | **227,763,973.16** |

| | | | |
|---|---|---|---|
| **ශුද්ධ වත්කම් ස්කන්ධය** | | | |
| මූලධනය | 11 | 75,787,890.44 | 75,787,890.44 |
| **රාජ්‍ය ප්‍රදාන - මූලධන** | 12 | 189,978,695.24 | 191,657,614.57 |
| පරිනාමාග - විවිධ | 13 | 14,928,330.28 | 12,932,280.28 |
| **ප්‍රාග්ධන සංචිත/ඉපයීම්** | | 2,131,366.30 | 2,131,366.30 |
| සංචිත ප්‍රතාහෙණන | | - | - |
| **සමුච්චිත අතිරික්තය/උනතාවය** | 14 | (128,394,745.02) | (54,745,178.43) |
| ශුද්ධ වත්කම්/ ස්කන්ධය | | **154,431,537.24** | **227,763,973.16** |

මෙම මූල්‍ය වාර්තා සිළියෙළ කිරීම් හා ඉදිරිපත් කිරීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳී සිටින අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

Chandrika Kumarathunga
Chairperson
Board of Directors
Wijaya Kumarathunga Memorial Hospital
Date :

CHAIRPERSON
WIJAYA KUMARATHUNGA MEMORIAL HOSPITAL
SEEDUWA.

N.A. Umagiliya
Director
Board of Directors
Wijaya Kumarathunga Memorial Hospital
Date :

DIRECTOR BOARD
WIJAYA KUMARATHUNGA MEMORIAL HOSPITAL
SEEDUWA.

Dr. U.L.R.M. Perera
Director
Wijaya Kumarathunga Memorial Hospital
Date :

Director
Wijaya Kumaratunga Memorial Hospital
Seeduwa

P.D.T.P.N. Bernard
Accountant
Wijaya Kumarathunga Memorial Hospital
Date : 01/03/2021

Accountant
Wijaya Kumaratunga Memorial Hospital
Seeduwa

# විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

## මූදල් ප්‍රවාහ ප්‍රකාශනය **2020** දෙසැම්බර් **31** අවසන් වන වර්ෂය

| | |
|---|---|
| **මූල්‍ය ප්‍රවහ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්** | |
| අතිරික්තය / හිඟ | (73,649,566.59) |
| **<u>මූදල් නොවන මාර්ග</u>** | |
| ක්ෂය | 28,817,869.33 |
| ක්‍රමක්ෂය | (28,817,869.33) |
| වැඩිවීම/අඩුවීම් - උපචිත වියදම් | (5,697,851.80) |
| වැඩිවීම/අඩුවීම් - ණය හිමියෝ | 72,697,424.29 |
| වැඩිවීම/අඩුවීම් - භාණ්ඩ තොග | (4,731,135.66) |
| වැඩිවීම/අඩුවීම් - පාරිතෝෂික වියදම් | 7,093,042.38 |
| වැඩිවීම/අඩුවීම් - ඉදිරියට ගෙවීම් | 27,159.84 |
| අඩුවීම - ලැබීමට නියමිත දෑ | (468,480.08) |
| ශුද්ධ මුදල් ගලන - මෙහෙයුම් ක්‍රියාකාරකම් | (4,729,407.62) |

| | |
|---|---|
| **මූදල් ගලන - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්** | |
| පිරියත හා උපකරණ මිලදී ගැනීම | (26,012,670.12) |
| ඉදිකිරීම් ප්‍රගතිය | (629,017.60) |
| ලත් ප්‍රාග්ධන ප්‍රධාන | 24,793,000.00 |
| ශුද්ධ මුදල් ගලන - ආයෝජන ක්‍රියාකාරකම් වලින් | (1,848,687.72) |

| | |
|---|---|
| **මූදල් ගලන - මූල්‍ය ක්‍රියාකාරකම් වලින්** | |
| ශුද්ධ මුදල් ගලන - මූල්‍ය ක්‍රියාකාරකම් වලින් | |
| ශුද්ධ වැඩිවීම/අඩුවීම - මූදල් හා මූදල් වලට සමාන දෑ | (6,578,095.34) |
| මූදල් හා මූදල් වලට සමාන දෑ - කාලාරම්භක | 37,669,054.86 |
| මුදල් හා මුදල් වලට සමාන දෑ - කාලාවසාන | 31,090,959.52 |

| | |
|---|---|
| **<u>මූදල් ගලන ප්‍රකාශනයේ සටහන්</u>** | |
| මූදල් හා මූදල් වලට සමාන දෑ | |
| බැංකු මූදල් | 31,030,069.52 |
| අතැති මූදල් | 60,890.00 |
| | 31,090,959.52 |

**විජය කුමාරතුංග අනුස්මරණ රෝහල**

**ශුද්ධ වත්කම් / ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය**

**2020** දෙසැම්බර් **31** අවසන් වර්ෂය සඳහා

| | රාජ්‍ය ප්‍රදාන ප්‍රාග්ධන | වෙනත් පරිත්‍යාග | වි.කු.අ.රෝ පදනම | ආයෝජන මණ්ඩලය | UDA | සංචිත ප්‍රාග්ධන ලාභ (හිඟ) | Revauation Reserve | ශුද්ධ අතිරික්තය | ඒකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය | 191,657,614.57 | 12,932,280.28 | 29,632,139.32 | 28,155,751.12 | 18,000,000.00 | 2,131,366.30 | - | (54,745,178.43) | 227,763,973.16 |
| | | | | | | | | | - |
| වසර තුල ස්ථාවර වත්කම් වැඩි වීම | - | - | - | - | - | - | - | - | - |
| | | | | | | | | | - |
| ලත් ප්‍රාග්ධන ප්‍රධාන වසර තුල | 24,793,000.00 | 4,342,000.00 | - | - | - | - | - | - | 29,135,000.00 |
| | | | | | | | | | - |
| ලත් ප්‍රාග්ධන ප්‍රධාන ක්‍රම ක්ෂය | (26,471,919.33) | (2,345,950.00) | - | - | - | - | - | - | (28,817,869.33) |
| | | | | | | | | | - |
| ශුද්ධ අතිරික්තය හිඟය කාලය තුල | - | - | - | - | - | - | - | (73,649,566.59) | (73,649,566.59) |
| | | | | | | | | | - |
| ගත වූ වසරේ ගැලපුම් | | - | - | - | - | - | - | - | - |
| | | | | | | | | | - |
| 2020.12.31 දිනට ශේෂය | **189,978,695.24** | **14,928,330.28** | **29,632,139.32** | **28,155,751.12** | **18,000,000.00** | **2,131,366.30** | **-** | **(128,394,745.02)** | **154,431,537.24** |
| | | | | | | | | | - |

**විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදුව**

**ස්ථාවර වත්කම් ලේඛනය - 2020 දෙසැම්බර් 31 දිනට**

(Rs)

| අයිතම | පිරිවැය 2020/01/01 දිනට | වසරේ එකතුවීම් | වසරේ ඉවත්කිරීම් | 2020/12/31 දිනට | අනු පාත ය | 2020/01/01 දිනට | පිරිවැය වසරේ එකතුවීම් | වසරේ ඉවත්කිරීම් | 2020/12/31 දිනට | 2020/12/31 දිනට ලියාහැරි අගය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඉඩම් | 27,159,873.50 | - | | 27,159,873.50 | | - | | | - | 27,159,873.50 |
| ගොඩනැගිලි සහ සවිකිරීම් | 192,424,909.11 | 10,526,153.64 | - | 202,951,062.75 | 2% | 44,049,267.79 | 4,059,021.25 | | 48,108,289.04 | 154,842,773.71 |
| වාහන | 26,458,792.90 | - | - | 26,458,792.90 | 20% | 19,658,787.90 | 1,700,000.00 | | 21,358,787.90 | 5,100,005.00 |
| ලී බඩු සවිකිරීම් සහ උපකරණ | 12,421,206.92 | 2,064,522.20 | 974,591.75 | 13,511,137.37 | 10% | 9,520,673.10 | 739,608.43 | 974,461.75 | 9,285,819.78 | 4,225,317.59 |
| යන්ත්‍රෝපකරණ | 28,819,941.35 | 1,045,606.68 | 2,363,070.75 | 27,502,477.28 | 15% | 11,396,275.36 | 3,523,818.46 | 2,363,045.75 | 12,557,048.07 | 14,945,429.21 |
| පරිගණක | 3,090,676.40 | 569,254.00 | 4,440.00 | 3,655,646.40 | 20% | 1,728,896.32 | 573,531.08 | 4,439.00 | 2,297,988.40 | 1,357,658.00 |
| වෛද්‍ය උපකරණ | 229,174,820.64 | 16,119,133.60 | - | 245,293,954.24 | 15% | 182,695,372.97 | 18,137,828.11 | | 200,833,201.08 | 44,460,753.16 |
| පුහුණු කිරීම් | 268,030.00 | 30,000.00 | - | 298,030.00 | 10% | 54,259.00 | 84,062.00 | | 138,321.00 | 159,709.00 |
